පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය

**08**

# අවසාන වාර පරීක්ෂණය - 2019

# විද්‍යාව

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................

..................................................

කාලය : පැය **2 ½** යි.

## I කොටස

**සැලකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

---

01. ආහාර සංචිත කරන කඳන් සඳහා උදාහරණ ශාකය තෝරන්න.

(1) කෙසෙල්. (2) ගොටුකොල. (3) කිතුල්. (4) ගොයම්

02. පහත රූපයේ දක්වා ඇති ශාකයේ ඇති මුල් වර්ගය වන්නේ,



(1) කයිරු මුල් ය. (2) ආලග්න මුල් ය. (3) වායව මුල් ය. (4) වායුධර මුල් ය.

03. සීනි බහුල ආහාර මත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය හඳුන්වන්නේ

(1) පූතිභවනය ලෙසයි.

(2) පැසීම ලෙසයි.

(3) මුඩුවීම ලෙසයි.

(4) මුඩුවීම හා පූතිභවනය ලෙයසි.

04. ගිනි ත්‍රිකෝණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1)




(2)




(3)




(4)




05. ස්වසනය සඳහා පෙනහැලි පමණක් භාවිත කරන සත්ත්ව කාණ්ඩ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) රෙප්ටීලියා, ඇම්ෆිබියා (2) ආවේස්, පිස්කේස්

(3) මැමේලියා, ඇම්ෆිබියා (4) රෙප්ටීලියා, ආවේස්

Education NCP - www.edncp.lk

06. දණ්ඩ චුම්භකයක චුම්භක ක්ෂේත්‍රය පිහිටන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.




07. රූපසටහනේ ආකාරයට පත්‍ර දාරයෙන් හෝ අග්‍රයෙන් ජලය පිටතට වැස්සීම හඳුන්වන නම තෝරන්න.



(1) බිංදුදය (2) ආස්‍රැතිය (3) උත්ස්වේදනය (4) ප්‍රභාසංස්ලේෂණය

08. පහත ඒවායින් මූල ද්‍රව්‍ය පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) Cu හා $Cl_2$ (2) Ca හා $CO_2$ (3) Zn හා MgO (4) Fe හා CaO

09. පදාර්ථයක් ඝන අවස්ථාවේ සිට ද්‍රව නොවී වායු අවස්ථාවට පත්වීම හඳුන්වන්නේ,

(1) ඝනීභවනය ලෙස ය. (2) ඌර්ධවපාතනය ලෙසය.
(3) විලයනය ලෙසය. (4) හිමායනය ලෙසය.

10. පහත ආකාරයේ ජීවන චක්‍රයක් හිමි සතුන් දෙදෙනා වන්නේ




01.මදුරුවා, කැරපොත්තා ය. 02. කැරපොත්තා, ගෙම්බා ය.
03.මදුරුවා, සමනලයා ය. 04. මිනිසා, ගෙම්බා ය.

11. චන්ද්‍රකලා ඇතිවීම සම්බන්ධයෙන් වන අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) පෘථිවිය චන්ද්‍රයා වටා පරිභ්‍රමනය වන නිසා චන්ද්‍රකලා ඇතිවේ.
(2) චන්ද්‍රයාගේ ආලෝකමත් වූ ප්‍රදේශ අපට පෙනෙන ආකාරය අනුව චන්ද්‍ර කලා ඇතිවේ.
(3) චන්ද්‍ර කලාවන් චන්ද්‍රයාගේ පරිභ්‍රමණය නිසා හටගනී.
(4) මාසයක් තුළ පසලොස්වක පෝය දින දෙකක් කිසිසෙත් ඇතිවිය නොහැකි ය.

12. පහත පරිපථය හා සම්බන්ධ සත්‍ය පිළිතුර තෝරන්න.




(1) S2 ස්වීචය විවෘත කර අනෙක් ස්වීච සංවෘත කළ විට C බල්බය දැල්වේ.
(2) A බල්බය දැල්වීමට S1 හා S3 සංවෘත කළ යුතුය.
(3) C බල්බය දැල්වීමට ස්වීච සියල්ල සංවෘත කළ යුතුය.
(4) A හා B බල්බ වලට S3 ස්විචයේ බලපෑමක් නැත.

Education NCP - www.edncp.lk

13. රූපයේ දැක්වෙන්නේ බන්සන් දැල්ලකි.




දී ඇති අක්ෂර අතරින් නොදැවුනු වායුව සහිත අදීප්ත කලාපය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

14. රාශි චක්‍රයට අයත් තරු රටා පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) මේෂ, සිංහ, තුලා, හත්දින්න

(2) වෘෂභ, කන්‍යා, ඔරායන්, කටක

(3) කටක, සිංහ, වෘශ්චික, ධනු

(4) වෘෂභ, මහ වලසා, කටක, මිථුන

15. ඝනත්ව කුප්පියට පහත ද්‍රව පුරවා ස්කන්ධය මනින ලදි.

A ජලය B පොල් තෙල් C ලුණු ද්‍රාවණය

ස්කන්ධ පිළිවෙළින් අඩුම හා වැඩිම ද්‍රව/ද්‍රාවණ වන්නේ,

(1) A හා C ය.

(2) B හා C ය.

(3) A හා B ය.

(4) B හා A ය.

16. මිනිස් සම හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න

A දේහ උෂ්ණත්ව පාලනයට උපකාරීවේ

B දේහයේ චලන සඳහා දායක වේ.

C බහිශ්‍රාවීය කාර්යය ඉටුකරයි.

ඉහත ප්‍රකාශ අතරින් සමෙහි කෘත්‍යයන් වන්නේ

(1) A පමණි (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි.

17. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) මගින් උපදෙස් ලබාගත යුත්තේ පහත කවර කටයුත්තක දී ද?

(1) ගොඩනැගිලි ඉදිකිරීමේ දී ශ්‍රමය ලබාගැනීමට.

(2) වියලි කලාපයේ ගොඩනැගිලි ඉදි කිරීමේ දී අමු ද්‍රව්‍ය ලබා ගැනීමට.

(3) නායයාමේ අවධානමක් ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදි කිරීමේ දී.

(4) ගොඩනැගිලි ද්‍රව්‍ය විකිනීමේ දී.

18. පහත රූපසටහනට අනුව උපකරණ අටවා ස්කන්ධය කිරා ප්ලාස්කුව ඇලකර මිශ්‍රවීමට සලස්වා නැවත ස්කන්ධය කිරණු ලැබේ. නිරීක්ෂණ සම්බන්ධ සත්‍ය ප්‍රකාශය තෝරන්න.




(1) ප්‍රතික්‍රියාවට පෙර හා පසු ස්කන්ධ සමාන වේ.

(2) ප්‍රතික්‍රියාවට පෙර ස්කන්ධය පසු ස්කන්ධයට වඩා වැඩිවේ.

(3) ප්‍රතික්‍රියාවෙන් පසු ස්කන්ධය වැඩිවේ.

(4) ප්‍රකාශයක් කිරීමට නිරීක්ෂණ ප්‍රමාණවත් නොවේ.

Education NCP - www.edncp.lk

19. වෘක්ක නිරෝගීව පවත්වා ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ.

(1) දිනපතා ප්‍රමාණවත් පරිදි පිරිසිදු ජලය පානය කිරීම.

(2) දුම් පානයෙන් හා මත්පැන් පානයෙන් වැළකීම.

(3) අධික ලවන සහිත ආහාර නිරතුරුව ගැනීම.

(4) දියවැඩියාව රෝගය වලක්වා ගැනීම හා පාලනය කර ගැනීම.

20. උත්ස්වේදනය වැලැක්වීමට ශාක දක්වන අනුවර්තන පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) පත්‍ර තලය සිහින් වීම / ඉටිසහිත උච්චර්ම පිහිටීම.

(2) පත්‍ර තලය පළල් වීම / පත්‍ර කටු බවට පත්වීම.

(3) පත්‍ර ප්‍රමාණය වැඩි වීම / පත්‍ර තලය පළල් වීම.

(4) පත්‍ර කටු බවට පත්වීම / පත්‍ර තලය පළල් වීම

## II – කොටස

**සැලකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

---

01. A 2019 වර්ෂයේ ජූලි මස 21 වන දින සඳ තරණයේ පනස් වන සංවත්සරය උත්සවාකාරයෙන් සැමරීමට නාසා ආයතනය කටයුතු කරන ලදි.

I. සඳමත පා තබන ලද මුල්ම මිනිසා කවුරුන් ද?

........................................................................................................................ (01)

II. ඉහත සඳ තරණය සඳහා සඳගාමීන් රැගෙන ගිය අභ්‍යාවකාශ යානයේ නම කුමක් ද?

........................................................................................................................ (01)

III. කෘත්‍රිම චන්ද්‍රිකා මගින් ලබා ගන්නා ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

........................................................................................................................ (01)

IV.a පහත රූපයේ දැක්වෙන තරු රටාව නම් කරන්න.



........................................................................................................................ (01)

b. මෙම තරු රටාවේ ඇති දීප්තිමත් තාරකාව කුමක් ද?

........................................................................................................................ (01)

V. ඔබ රාත්‍රී අහස පියවි ඇසින් නිරීක්ෂණය කරන විට තාරකා සහ ග්‍රහලෝක වෙන්කර හඳුනාගන්නේ කෙසේ ද?

........................................................................................................................ (01)

Education NCP - www.edncp.lk

B I. විද්‍යුත් විසර්ජනය සිදුවන ආකාරය අනුව අකුණු වර්ග තුනකි. ඒවායින් දෙකක් නම් කරන්න.

A.......................................................... B.......................................................... (02)

II. අකුණු අනතුරු අවම කරගැනීමට උස් ගොඩනැගිලිවලට සම්බන්ධ කරන පහත රූපයේ X ලෙස දැක්වෙන උපාංගය කුමක් ද?




.................................................................................................................................. (01)

III. නියඟ ඇතිවීමට බලපාන ස්වභාවික හේතු දෙකක් සඳහන් කරන්න.

..................................................................................................................................

.................................................................................................................................. (02)

IV. ගංවතුර ආපදා තත්වයකදී ඇතිවන හානි අවම කරගැනීමට යෙදිය හැකි පූර්වෝපායක් සඳහන් කරන්න.

.................................................................................................................................. (01)

02. A රූපයේ දැක්වෙන පරිපථය නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. රූපයේ ඇති විද්‍යුත් පරිපථයේ විද්‍යුත් කෝෂ හා බල්බ සම්බන්ධ කර ඇති ආකාර පිළිවෙලින් සඳහන් කරන්න. (02)

II. ඉහත පරිපථය සම්මත සංකේත භාවිත කර පරිපථ සටහනකින් ඉදිරිපත් කරන්න. (02)

III. පරිපථයේ S උපකරණය මගින් කෙරෙන් කාර්යය සඳහන් කරන්න. (01)

B පහත රූපයේ දැක්වෙන්නේ 8 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් විසින් නිර්මාණය කළ විදුලි සීනුවකි.




I. S ස්විචය වැසූ විට ඔබට දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (01)

II. ඉහත නිරීක්ෂණයට හේතු වන්නේ විද්‍යුත් ධාරාවේ කුමන ඵලය ද? (01)

Education NCP - www.edncp.lk

III. ඉහත II. හි ඔබ සඳහන් කළ ඵලය භාවිතයට ගන්නා වෙනත් අවස්ථාවක් ලියන්න. (01)

III. නිවෙස් ආලෝකමත් කිරීමට LED පහන් භාවිතය වඩාත් වාසිදායක බව සිසුවෙකු ප්‍රකාශ කරයි.

a. ඔහුගේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? (01)

b. ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (01)

IV. LED යක පරිපථ සංකේතය ඇඳ දක්වන්න. (02)

03. ආහාර ද්‍රව්‍යක් මිලදී ගැනීමේ දී ඇසුරුම් ලේබලයක සඳහන් තොරතුරු පිළිබඳව සැලකිලිමත් විය යුතුය. පහත දී ඇත්තේ ආහාර ලේබලයක කොටසකි.

අඩංගු ද්‍රව්‍ය - හාල් පිටි
පොල් තෙල්
ලුණු
අනුමත වර්ණක
වර්ණකාරක
රසකාරක
පිපුම් කාරක
ශුද්ධ බර - 250g
නිෂ්පාදිත දිනය - 2019-01-25
ක.ඉ.දි - 2019-02-25
SLS

A. I. මෙවැනි ආහාර ඇසුරුම් ලේබලයක අඩංගු වියයුතු වැදගත් තොරතුරු දෙකක් සඳහන් කරන්න. (02)

II. ආහාර ද්‍රව්‍යක් ඇසුරුම් කිරීමේ වාසියක් සඳහක් කරන්න. (01)

III. ඉහත ආහාර ඇසුරුම විවෘත කර දින තුනක් පමණ පරිසරයේ තබන ලදි.

දින තුනකට පසු දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (01)

IV. කෝඩියල් හා ජෑම් වැනි ද්‍රව්‍ය කල් තබා ගැනීම සඳහා යොදා ගතහැකි පරිරක්ෂණ ක්‍රමයක් සඳහන් කරන්න. (01)

V. ඔබ ඉහත IV හි සඳහන් කළ පරිරක්ෂණ ක්‍රමයේ දී පාලනය කරන සාධකයක් සඳහන් කරන්න. (01)

B. ක්ෂුද්‍ර ජීවීන් මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රයෝජනවත් මෙන්ම හානිදායක ලෙසද බලපෑම් ඇති කරයි



X



Y

I. ඉහත X හා Y රූප සටහන් වලින් පෙන්නුම් කරන ක්ෂුද්‍රජීවී විශේෂ දෙක පිළිවෙළින් නම් කරන්න. (01)

II. ඉහත X මගින් නිරූපණය වන ක්ෂුද්‍ර ජීවියා මගින් මිනිසාට ඇතිවන රෝගයක් සඳහන් කරන්න. (01)

III. ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය සඳහා අවශ්‍ය සාධක දෙකක් සඳහන් කරන්න. (02)

IV. ක්ෂුද්‍ර ජීවීන් ප්‍රයෝජනවත්ව භාවිත කරන කර්මාන්තයක් ලියන්න. (01)

Education NCP - www.edncp.lk

04. A පහත දැක්වෙන්නේ විද්‍යාගාරයේ දී හමුවන පදාර්ථ කිහිපයකි.

(සල්ෆර්, පොටෑසියම් පර්මැන්ගනේට් ද්‍රාවණය, නයිට්‍රජන් ඩයොක්සයිඩ්, කාබන් කූර, කාබන් ඩයොක්සයිඩ්, කොපර් සල්ෆේට්)

ඉහත පදාර්ථ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. කහ පැහැති ඝන ද්‍රව්‍යක් නම් කරන්න.

II. දම් පැහැති ද්‍රාවණය කුමක් ද?

III. දුඹුරු පැහැති වායුව නම් කරන්න.

IV. ඝන විද්‍යුත් සන්නායක කුමක් ද? (04)

B. ප්‍රභාසංස්ලේෂණය යනු ශාකවල සිදුවන ප්‍රධාන ජෛව ක්‍රියාවලියකි.

I. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය පූටිකා හරහා ශාක පත්‍ර තුළට ඇතුළුවන ද්‍රව්‍ය නම් කරන්න. (01)

II. ප්‍රභාසංස්ලේෂණයේ ප්‍රධාන ඵලය නම් කරන්න. (01)

III. ඉහත II. හි සඳහන් කළ ද්‍රව්‍ය පත්‍ර තුළ තාවකාලිකව ගබඩා වන්නේ කුමන ද්‍රව්‍ය ලෙස ද? (01)

IV.ඉහත III. හි සඳහන් කළ ද්‍රව්‍ය පත්‍ර තුළ අඩංගු බව පරීක්ෂා කිරීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය කුමක් ද? (01)

C. යකඩ මල බැඳීම සඳහා අවශ්‍ය සාධකය පරීක්ෂා කිරීමට සිසුන් කණ්ඩායමක් සකස් කළ ඇටවුමක් පහත රූපයේ දැක්වේ.




I. දින කිහිපයකට පසුව A හා B පරීක්ෂණ නලවල දක්නට ලැබෙන නිරීක්ෂණ වෙන වෙනම ලියන්න. (02)

II. ඉහත නිරීක්ෂණවලට හේතුව පැහැදිලි කරන්න. (01)

05. පහත රූපයේ දැක්වෙන්නේ මිනිසාගේ මධ්‍ය ස්නායු පද්ධතියේ රූප සටහනකි.




A I. රූපයේ A හා B කොටස් පිළිවෙළින් නම් කරන්න (02)

II. C කොටසින් කෙරෙන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (02)

III. මිනිසාගේ මධ්‍ය ස්නායු පද්ධතියේ ආරක්ෂාවට පිහිටා ඇති හැඩගැසීම් දෙකක් ලියන්න. (02)

Education NCP - www.edncp.lk

B. I. කශේරුව සහිත හා රහිත බව අනුව සතුන් වර්ග කළහැකි ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න. (02)

II. සිසුන් පිරිසක් පාසල් වත්තේ සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවක දී නිරීක්ෂණය කළ සතුන් කිහිප දෙනෙකුගේ ලක්ෂණ පහත වගුවේ දැක්වේ.

| සත්වයා | ලක්ෂණ |
|---|---|
| X | සන්ධි සහිත උපාංග දැරීම |
| ගැඩවිලා | Y |
| සමනලයා | බාහිර සැකිල්ලක් ඇත. |
| Z | බාහිර කවචයක් ඇත. |

වගුවේ X Y Z වලින් දක්වා ඇත්තේ මොනවා දැයි සඳහන් කරන්න. (03)

III. වගුවේ එකම කාණ්ඩයට අයත් සතුන් දෙදෙනෙකු ඇත. එම සත්ත්ව කාණ්ඩය නම් කරන්න. (01)

06. A. එක හා සමාන සිරස් උස වීදුරු හයක් ගෙන රූපයේ දැක්වෙන පරිදි වෙනස් ජල පරිමා එක් කර ඇත. 8 ශ්‍රේණියේ සිසුවකු විසින් වීදුරු වල දාරයට අනුපිළිවෙලින් ලෝහ හැන්දකින් තට්ටු කර ඇසෙන ශබ්දය හොඳින් ශ්‍රවණය කරයි.




I. හඬේ වැඩිම තීව්‍රතාවයක් නිරීක්ෂණය වන වීදුරුව කුමක් ද? (01)

II. ඉහත නිරීක්ෂණයට හේතුව සඳහන් කරන්න. (01)

III. ඉහත II. හි සඳහන් සංකල්පය භාවිතා කරමින් සංගීතය නිපදවීමට සකස් කර ඇති භාණ්ඩයක් නම් කරන්න.

IV. ඉහත II. හි සඳහන් සංකල්පය හැරුණු විට සංගීතය නිපදවන වෙනත් ක්‍රම දෙකක් ලියන්න. (01)

B. I. ජලය සහිත වීදුරුව තුලට කොන්ඩිස් කැටයක් දැමූ පසු දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (01)

II. ඉහත නිරීක්ෂණයට හේතුව පැහැදිලි කරන්න. (01)

III. කොන්ඩිස් වල රසායන විද්‍යාත්මක නාමය ලියන්න. (01)

IV. ලෝහ හැන්ද සතු භෞතික ලක්ෂණ 02 ක් ලියන්න. (02)

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 08

තෙවන වාර පරීක්ෂණය - 2019

විද්‍යාව පිළිතුරු පත්‍රය

## I කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 40 කි.

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|
| 01 | 3 | 11 | 1 |
| 02 | 1 | 12 | 1,2 |
| 03 | 2 | 13 | 4 |
| 04 | 4 | 14 | 3 |
| 05 | 4 | 15 | 2 |
| 06 | 1 | 16 | 4 |
| 07 | 1 | 17 | 3 |
| 08 | 1 | 18 | 1 |
| 09 | 2 | 19 | 3 |
| 10 | 3 | 20 | 1 |

## II කොටස

## ii – කොටස

**සැලකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. A 2019 වර්ෂයේ ජූලි මස 21 වන දින සඳ තරණයේ පනස් වන සංවත්සරය උත්සවාකාරයෙන් සැමරීමට නසා ආයතනය කටයුතු කරන ලදි.

I. සඳමත පා තබන ලද මුල්ම මිනිසා කවුරුන් ද?

නීල් ආම්ස්ට්‍රෝං

........................................................................................................ (ලකුණු.01)

II. ඉහත සඳ තරණය සඳහා සඳගාමීන් රැගෙන ගිය අභ්‍යාවකාශ යානයේ නම කුමක් ද?

ඇපලෝ 11

........................................................................................................ (ලකුණු.01)

III. කෘත්‍රිම චන්ද්‍රිකා මගින් ලබා ගන්නා ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

සන්නිවේදන කටයුතු

........................................................................................................ (ලකුණු.01)

IV.a පහත රූපයේ දැක්වෙන තරු රටාව නම් කරන්න.



සිංහ (ලියෝ)

........................................................................................................ (ලකුණු.01)

b. මෙම තරු රටවේ ඇති දීප්තිමත් තාරකාව කුමක් ද?

රෙගියුලස්
.................................................................................................................................... (ලකුණු.01)

V. ඔබ රාත්‍රී අහස පියවි ඇසින් නිරීක්ෂණය කරන විට තාරකා සහ ග්‍රහලෝක වෙන්කර හඳුනාගන්නේ කෙසේ ද?

තරුවක දිදුලන ස්වභාවය වැනි ගැලපෙන පිළිතුරකට
.................................................................................................................................... (ලකුණු.01)

B I. විද්‍යුත් විසර්ජනය සිදුවන ආකාරය අනුව අකුණු වර්ග තුනකි. ඒවායින් දෙකක් නම් කරන්න.

A. වා අකුණු ................................................... B. වලා අකුණු ................................................... (ලකුණු.02)

II. අකුණු අනතුරු අවම කරගැනීමට උස් ගොඩනැගිලිවලට සම්බන්ධ කරන පහත රූපයේ X ලෙස දැක්වෙන උපාංගය කුමක් ද?




අකුණු සන්නායක
.................................................................................................................................... (ලකුණු.01)

III. නියඟ ඇතිවීමට බලපාන ස්වභාවික හේතු දෙකක් සඳහන් කරන්න.

එල්නිනෝ / වියළි සුළං ප්‍රවාහ තත්ව
....................................................................................................................................

.................................................................................................................................... (ලකුණු.02)

IV. ගංවතුර ආපදා තත්වයකදී ඇතිවන හානි අවම කරගැනීමට යෙදිය හැකි පූර්වෝපායක් සඳහන් කරන්න.

සුදුසු පිළිතුරකට
....................................................................................................................................(ලකුණු.01)

02. A රූපයේ දැක්වෙන පරිපථය නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. රූපයේ ඇති විද්‍යුත් පරිපථයේ විද්‍යුත් කෝෂ හා බල්බ සම්බන්ධ කර ඇති ආකාර පිළිවෙලින් සඳහන් කරන්න.

කෝෂ - ශ්‍රේණිගතව බල්බ - සමාන්තරගතව
....................................................................................................................................

.................................................................................................................................... (ලකුණු.02)

II. ඉහත පරිපථය සම්මත සංකේත භාවිත කර පරපථ සටහනකින් ඉදිරිපත් කරන්න.



(ලකුණු.02)

III. පරිපථයේ S උපකරණය මගින් කෙරෙන් කාර්යය සඳහන් කරන්න.

පරිපථය සංවෘත හෝ විවෘත කිරීම ........................................................................................ (ලකුණු.1)

B පහත රූපයේ දැක්වෙන්නේ 8 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් විසින් නිර්මාණය කළ විදුලි සීනුවකි.




I. S ස්වීචය වැසූ විට ඔබට දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක් ද?

කියත් පටිය ඉහල පහල යමින් සීනුව නාද වේ (ලකුණු.1)

II. ඉහත නිරීක්ෂණයට හේතු වන්නේ විද්‍යුත් ධාරාවේ කුමන ඵලය ද?

චුම්බක ඵලය (ලකුණු.1)

III. ඉහත II. හි ඔබ සඳහන් කළ ඵලය භාවිතයට ගන්නා වෙනත් අවස්ථාවක් ලියන්න.

විදුලි සීනු සෑදීමට

IV. නිවෙස් ආලෝකමත් කිරීමට LED පහන් භාවිතය වඩාත් වාසිදායක බව සිසුවෙකු ප්‍රකාශ කරයි.

a. ඔහුගේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද?

ඔව්

b. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

අඩු විද්‍යුත් ශක්තියකින් වැඩි ආලෝක ශක්තියක් ලබාගැනීම වැනි පිළිතුරක්

V. LED යක පරිපථ සංකේතය ඇඳ දක්වන්න.



( )

03. ආහාර ද්‍රව්‍යක් මිලදී ගැනීමේ දී ඇසුරුම් ලේබලයක් සඳහන් තොරතුරු පිළිබඳව සැලකිළිමත් විය යුතුය. පහත දී ඇත්තේ ආහාර ලේබලයක කොටසකි.

අඩංගු ද්‍රව්‍ය - හාල් පිටි
පොල් තෙල්
ලුණු
අනුමත වර්ණක
වර්ණකාරක
රසකාරක
පිපුම් කාරක
ශුද්ධ බර - 250g
නිෂ්පාදිත දිනය - 2019-01-25
ක.ඉ.දි - 2019-02-25
SLS

A. I. මෙවැනි ආහාර ඇසුරුම් ලේබලයක අඩංගු වියයුතු වැදගත් තොරතුරු දෙකක් සඳහන් කරන්න. (ලකුණු.02)

සුදුසු පිළිතුරක්

II. ආහාර ද්‍රව්‍යක් ඇසුරුම් කිරීමේ වාසියක් සඳහක් කරන්න. (ලකුණු.01)

සුදුසු පිළිතුරක්

III. ඉහත ආහාර ඇසුරුම විවෘත කර දින තුනක් පමණ පරිසරයේ තබන ලදි.

දින තුනකට පසු දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (ලකුණු.01)

වර්ණය වෙනස් වීම / වයනය වෙනස් වීම / ගන්ධය

IV. කෝඩියල් හා ජෑම් වැනි ද්‍රව්‍ය කල් තබා ගැනීම සඳහා යොදා ගතහැකි පරිරක්ෂණ ක්‍රමයක් සඳහන් කරන්න.

සාන්ද්‍රීකරණය (ලකුණු.01)

V. ඔබ ඉහත IV හි සඳහන් කළ පරිරක්ෂණ ක්‍රමයේ දී පාලනය කරන සාධකයක් සඳහන් කරන්න. (ලකුණු.01)

තෙතමනය / ජලය

B. ක්ෂුද්‍ර ජීවීන් මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රයෝජනවත් මෙන්ම හානිදායක ලෙසද බලපෑම් ඇති කරයි



X



Y

I. ඉහත X හා Y රූප සටහන් වලින් පෙන්නුම් කරන ක්ෂුද්‍රජීවී විශේෂ දෙක පිළිවෙළින් නම් කරන්න.(ලකුණු.01)

X ඇමීබා Y මියුකෝර්

II. ඉහත X මගින් නිරූපණය වන ක්ෂුද්‍ර ජීවියා මගින් මිනිසාට ඇතිවන රෝගයක් සඳහන් කරන්න. (ලකුණු.01)

ඇමීබික් අතීසාරය

III. ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය සඳහා අවශ්‍ය සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු.02)

තෙතමනය උෂ්ණත්වය

IV. ක්ෂුද්‍ර ජීවීන් ප්‍රයෝජනවත්ව භාවිතා කරන් කර්මාන්තයක් ලියන්න. (ලකුණු.01)

සුදුසු පිළිතුරක්

04. A පහත දැක්වෙන්නේ විද්‍යාගාරයේ දී හමුවන පදාර්ථ කිහිපයකි.

(සල්ෆර්, පොටෑසියම් පර්මැන්ගනේට් ද්‍රාවණය, නයිට්‍රජන් ඩයොක්සයිඩ්, කාබන් කූර, කාබන් ඩයොක්සයිඩ්, කොපර් සල්ෆේට්)

ඉහත පදාර්ථ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. කහ පැහැති ඝන ද්‍රව්‍යක් නම් කරන්න.

සල්ෆර්

II. දම් පැහැති ද්‍රවණය කුමක් ද?

පොටෑසියම් පර්මැන්ගනේට් ද්‍රාවණය

III. දුඹුරු පැහැති වායුව නම් කරන්න.

නයිට්‍රජන් ඩයොක්සයිඩ්

IV. ඝන විද්‍යුත් සන්නායක කුමක් ද? (ලකුණු.04)

කාබන් කූර

B. ප්‍රභාසංස්ලේෂණය යනු ශාකවල සිදුවන ප්‍රධාන ජෛව ක්‍රියාවලියකි.

I. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය පූටිකා හරහා ශාක පත්‍ර තුළට ඇතුළුවන ද්‍රව්‍ය නම් කරන්න. (ලකුණු.01)

කාබන් ඩයොක්සයිඩ්

II. ප්‍රභාසංස්ලේෂණයේ ප්‍රධාන ඵලය නම් කරන්න. (ලකුණු.01)

ග්ලූකෝස්

III. ඉහත II. හි සඳහන් කළ ද්‍රව්‍ය පත්‍ර තුළ තාවකාලිකව ගබඩා වන්නේ කුමන ද්‍රව්‍ය ලෙස ද? (ලකුණු.01)

පිෂ්ටය ලෙස

IV.ඉහත III. හි සඳහන් කළ ද්‍රව්‍ය පත්‍ර තුළ අඩංගු බව පරීක්ෂා කිරීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය කුමක් ද?

අයඩීන් ද්‍රවණය (ලකුණු.01)

C. යකඩ මල බැඳීම සඳහා අවශ්‍ය සාධකය පරීක්ෂා කිරීමට සිසුන් කණ්ඩායමක් සකස් කළ ඇටවුමක් පහත රූපයේ දැක්වේ.




I. දින කිහිපයකට පසුව A හා B පරීක්ෂණ නලවල දක්නට ලැබෙන නිරීක්ෂණ වෙන වෙනම ලියන්න.

A නලයේ ජල මට්ටම එලෙසම පවතින අතර B නලයේ ජල මට්ටම ඉහල ගොස් ඇත (ලකුණු.02)

II. ඉහත නිරීක්ෂණවලට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු.01)

B නලයේ ඇ යකඩ කුඩු ඔක්සිජන් සමග ප්‍රතික්‍රියා කරන නිසා ජල මට්ටම ඉහල ගොස් ඇත

05. පහත රූපයේ දැක්වෙන්නේ මිනිසාගේ මධ්‍ය ස්නායු පද්ධතියේ රූප සටහනකි.




A I. රූපයේ A හා B කොටස් පිළිවෙළින් නම් කරන්න (ලකුණු.02)

A මස්තිස්කය B අනු මස්තිස්කය C සුසුම්නා සීර්ශකය

II. C කොටසින් කෙරෙන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු.02)

හෘද ස්පන්දන වේගය, ශ්වසන වේගය වැනි සිතා මතා පාලනය කල නොහැකි දෑ

III. මිනිසාගේ මධ්‍ය ස්නායු පද්ධතියේ ආරක්ෂාවට පිහිටා ඇති හැඩගැසීම් දෙකක් ලියන්න. (ලකුණු.02)

1.මොළය වටා පිහිටා ඇති අස්ථිමය කපාලය පිහිටිම සුෂුම්නාව වටා පිහිටි අස්ථිමය ව්‍යුහය වන කශේරුව පිහිටම

2.මොළය හා සුෂුම්නාව යන අවයව දෙක වටා ම ඒවායේ ආරක්ෂාව සඳහා මෙනින්ජ් පටල ලෙස හැඳින්වෙන විශේෂිත පටල වර්ගයක් පිහිටම

B. I. කශේරුව සහිත හා රහිත බව අනුව සතුන් වර්ග කළහැකි ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න. (ලකුණු.02)

පෘෂ්ටවංශී / අපෘෂ්ටවංශී

II. සිසුන් පිරිසක් පාසල් වත්තේ සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවක දී නිරීක්ෂණය කළ සතුන් කිහිප දෙනෙකුගේ ලක්ෂණ පහත වගුවේ දැක්වේ.

| සත්වයා | ලක්ෂණ |
|---|---|
| කුමන හෝ ආත්‍රපෝඩාවෙක් | සන්ධි සහිත උපාංග දැරීම |
| ගැඩවිලා | දේහය බණ්ඩවලට බෙදී ඇත වැනි සුදුසු පිළිතුක් |
| සමනලයා | බාහිර සැකිල්ලක් ඇත. |
| ගොළුබෙල්ලා | බාහිර කවචයක් ඇත. |

වගුවේ X Y Z වලින් දක්වා ඇත්තේ මොනවා දැයි සඳහන් කරන්න. (ලකුණු.03)

III. වගුවේ එකම කාණ්ඩයට අයත් සතුන් දෙදෙනෙකු ඇත. එම සත්ත්ව කාණ්ඩය නම් කරන්න. (ලකුණු.01)

ආත්‍රපෝඩා

06. A. එක හා සමාන සිරස් උස වීදුරු හයක් ගෙන රූපයේ දැක්වෙන පරිදි වෙනස් ජල පරිමා එක් කර ඇත. 8 ශ්‍රේණියේ සිසුවකු විසින් වීදුරු වල දාරයට අණුපිළිවෙලින් ලෝහ හැන්දකින් තට්ටු කර ඇසෙන ශබ්දය හොඳින් ශ්‍රවණය කරයි.




I. හඬේ වැඩිම තීව්‍රතාවයක් නිරීක්ෂණය වන වීදුරුව කුමක් ද? (ලකුණු.01)

A

II. ඉහත නිරීක්ෂණයට හේතුව සඳහන් කරන්න. (ලකුණු.01)

වායු කඳේ දිග අඩු වීම

III. ඉහත II. හි සඳහන් සංකල්පය භාවිතා කරමින් සංගීතය නිපදවීමට සකස් කර ඇති භාණ්ඩයක් නම් කරන්න.

බට නලාව වැනි පිළිතුරක්

IV. ඉහත II. හි සඳහන් සංකල්පය හැරුණු විට සංගීතය නිපදවන වෙනත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු.01)

තන්තු කම්පනය , පටල කම්පනය

B. I. ජලය සහිත වීදුරුව තුලට කොන්ඩිස් කැටයක් දැමූ පසු දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (ලකුණු.01)

සුදුසු පිළිතුරක්

II. ඉහත නිරීක්ෂණයට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු.01)

ද්‍රව පදාර්ථ වල අසන්තතික බව

III. කොන්ඩිස් වල රසායන විද්‍යාත්මක නාමය ලියන්න. (ලකුණු.01)

පොටෑසියම් පර්මැන්ගනේට්

IV. ලෝහ හැන්ද සතු භෞතික ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු.02)

හොඳින් විද්‍යුතය සන්නයනය / හොඳින් තාප සන්නයනය